# සිව් දිගින් වඩිනා මහ සඟනට ලෙණක් පූජා කර දෙව්ලොව මනුලොව සැරිසරා සසරින් එතෙර වන්න

## සොණකොටිවීස ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 544 - 547)

විපස්සී බුදු රජුන්ගේ කාලයේ දී එක් පුද්ගලයෙක් ලෙණක් කරවා සතර දිගින් වඩිනා මහ සඟනට පූජා කළා. ඒ අවස්ථාවේ ඔහු ඉතා සතුටු සිත් ඇති ව ප්‍රාර්ථනාවක් ද කළා.

මෙහි ආනිසංස ලෙස කල්ප අනූවක් ඔහු සුගතියේ ම වාසය කර ගෞතම බුදු සසුනේ පැවිදි ව සියලු කෙලෙස් නසා රහත් බව ලැබුවා. ආරබ්ධ වීර්ය ඇති මහණුන් අතරින් අග්‍ර බව ද ලැබුවා.